## උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය - 2017

---

උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2010 අගෝස්තු 27 දින එළඹි අංක 2639 -එස්ආර්අයි දරණ ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ණය ගිවිසුම අනුව එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමේ නියෝජිතායතනය වේ. ජාතික මට්ටමින් ව්‍යාපෘති කටයුතු කළමනාකරණය හා සම්බන්ධීකරණය සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වගකීම දරයි. උතුරු හා උතුරු මැද පළාත්වල ජාතික මාර්ග කිලෝමීටර් 170 ක් පුනරුත්ථානය කිරීම හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ආරම්භක ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 16,790 කට සමාන එජඩො මිලියන 146 ක් වන අතර, රු.මිලියන 14,950 කට සමාන එජඩො මිලියන 130 ක් මූල්‍යායනය කිරිම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. තවද, ආසියානු සංවර්ධන බැංකුව විසින් 2013 මැයි 31 දිනැති අංක 2890 එස්ආර්අයි (එස්එෆ්) දරණ ණය ගිවිසුම යටතේ රු.මිලියන 8,840 කට සමාන එජඩො මිලියන 68 ක අතිරේක මූල්‍යායනයක් වෙන්කර තිබුණු අතර, මෙයින් රු.මිලියන 4,420 කට සමාන එජඩො මිලියන 34 ක් උතුරු හා උතුරු මැද පළාත්වල පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා වෙන්කර තිබුණි. ඊට අමතරව, ආසියානු සංවර්ධන බැංකුව විසින් 2013 මැයි 31 දිනැති අංක 2891 එස්ආර්අයි දරණ ණය ගිවිසුම යටතේ රු.මිලියන 3,900 කට සමාන එජඩො මිලියන 30 ක් උතුරු හා උතුරු මැද පළාත්වල ජාතික මාර්ග මහාමාර්ග සඳහා වෙන්කර දී තිබුණි. ආරම්භක ණය ගිවිසුම යටතේ ව්‍යාපෘතිය එකී කටයුතු 2010 ඔක්තෝබර් 22 දින ආරම්භ කරන ලද අතර, 2015 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. අතිරේක මූල්‍යයන සැලසුම් යටතේ ව්‍යාපාතියේ කටයුතු 2013 මැයි 13 දින ආරම්භ කරන ලද අතර, 2017 දෙසැම්බර් 31 දින වනවිට නිම කිරීමට නියමිත විය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාහන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට හා මූල්‍ය ප්රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි

සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. මා විසින් මාගේ විගණන අරමුණු සඳහා අවශ්‍ය ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මාගේ උපරිම දැනුම් සහ විශ්වාසය මත ලබාගෙන ඇත. එබැවින් මාගේ විගණනය මාගේ මතය සඳහා සාධාරණ පදනමක් ලබාදෙන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් හා ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණයවලින් කරන ලද මිලදීගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වුයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණ කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

----------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් යටතේ සිවිල් වැඩ 2015 දෙසැම්බර් 31 දිනට නිමකර තිබුණද, එම වැඩවල වටිනාකමින් රු.මිලියන 21.57 ක් අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශන තුළ කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි.

(ආ) මාර්ග සංවර්ධන අධිකාරියට පවරන ලද වටිනාකම රු.මිලියන 276.33 ක් වූ මෝටර් රථවල අගය මූල්‍ය ප්‍රකාශන තුළ රු.මිලියන 284 ක් ලෙස වැරදි සහගතව ඉදිරිපත් කර තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | අරමුදල් උපයෝජනය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 2017 වර්ෂය තුළ | 2017 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| **ආසියානු සංවර්ධන බැංකුව** | | | | | | |
| - 2639 | 130 | 14,950 | 86.00 | 81.56 | 127.28 | 16,103.77 |
| - 2890 | 34 | 4,420 | 450.00 | 409.70 | 28.19 | 3,911.74 |
| - 2891 | 30 | 3,900 | - | 246.83 | 22.69 | 3,077.27 |
| **ශ්‍රී ලංකා රජය** | - | 2,080 | 25.30 | 10.92 | 0.58 | 74.95 |
| එකතුව | 194 | 25,350 | 561.30 | 749.01 | 178.74 | 23,167.73 |

### 3.2 භෞතික ප්‍රගතිය

ලබාගත හැකි වූ තොරතුරු අනුව, පුනරුත්ථාපනය කරන ලද ජාතික මාර්ග 03 ක වර්ෂ 03 ක කාර්යසාධන පදනම් නඩත්තු වැඩ ඇතුළත් පැකේජ 10 ක් යටතේ කිලෝමීටර් 170 ක දිගින් යුත් උතුරු හා උතුරු මැද පළාත්වල ජාතික මාර්ග 10 ක පුනරුත්ථාපන වැඩ 2015 දෙසැම්බර් 31 වන විටත් නිමකර තිබුණි. තවද, ආරම්භක ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම යටතේ උතුරු හා උතුරුමැද පළාත්වල මාර්ග පුනරුත්ථාපනය මත ඉතිරිකිරීම් යොදා ගනිමින් වෙනත් ජාතික මාර්ග 02 ක් පුනරුත්ථාපනය සඳහා 2015 වර්ෂයේදී ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තු හා අතිරේක මූල්‍යායන සැකසුම් 2016 දෙසැම්බර් 31 දිනට නිමකර තිබුණි. රබෑව සිට මැදවච්චිය දක්වා කිලෝමීටර් 9.64 කින් යුත් මහනුවර යාපනය මාර්ගයේ කොටසක් පුනරුත්ථාපනයට 2017 අප්‍රේල් 28 නව කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණු අතර, 2017 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතිය සියයට 49 ක් ලෙස පැවතුණි.

## 3.3 මතභේදයට තුඩුදුන් කරුණු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුනරුත්ථාපනයට කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට අමතරව ව්‍යාපෘතිය විසින් පුනරුත්ථාපනය කරන ලද ජාතික මාර්ග 22 කින් ජාතික මාර්ග 20 ක් නඩත්තු කිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 232.19 ක කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණි. මින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික මාර්ග 11 ක් වසර 03 ක් සඳහා එහෙත් අනෙකුත් ජාතික මාර්ග 09 ක් වසර 05 ක් සඳහාද, ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමේ කාලය පිළිබඳ සැලකිල්ලකින් තොරව නඩත්තු කටයුතු සඳහා කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ලබාගත හැකි වූ තොරතුරු අනුව, ව්‍යාපෘතිය විසින් ඔඩ්ඩුසුදාන්, මුල්ලිවෙයික්කාල් සහ මාඩු හන්දිය යන ප්‍රදේශයන්හි ඉදිකරන ලද රු.මිලියන 90.1 ක පිරිවැයක් වූ කාර්යාල ගොඩනැගිලි හා සේවක නිවාස 2017 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියට පවරා තිබුණි. කෙසේ වුවත්, එබදු දේපල පවරන ලද දිනයක් සහ භාරගන්නා ලද පාර්ශවයන් ආදිය පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොවුණු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස එම දේපලවල පැවැත්ම හා බලාපොරොත්තු වූ අරමුණු සඳහා එම දේපල යොදා ගත්තාද යන්න විගණනයට නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 3.4 ඵලදායි නොවන ගනුදෙනු

ව්‍යාපෘතියේ මාර්ග පුනරුත්ථාපන කාර්යයේ නිරත වන කොන්ත්‍රාත්කරුවන්ට ඔවුන්ගේ ක්‍රියාකාරකම් සඳහා භාවිතයට මෝටර් වාහන සෘජුව ආනයනය කිරීමට අවසර දී තිබුණු බව නිරීක්ෂණය විය. එබැවින්, 2017 දෙසැම්බර් 31 දින වන විට 2013 සිට 2016 දක්වා රු.මිලියන 284 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද මෝටර් වාහන 37 ක් මාර්ග සංවර්ධන අධිකාරියට පවරා තිබුණු අතර, රු.මිලියන 89.6 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද තවත් මෝටර් වාහන 10 ක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි තිබුණි. ඒ පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත සඳහන් කළ මෝටර් වාහන 10 ට අතිරේකව ව්‍යාපෘතිය විසින් වර්ෂය තුළදී මෝටර් වාහන 02 ක් කුලියට ගැනීමට ක්‍රියාකර තිබු බව නිරීක්ෂණය විය. කල්බදු ගිවිසුම් අනුව එක් මෝටර් රථයක් එක් මාසයක් තුළ උපරිම කිලෝමීටර් 2,500 ක සීමාවකට ධාවනය කිරීමට නියමිත විය. ව්‍යාපෘතිය විසින් 2017 දෙසැම්බර් 31 දින වනවිට කිලෝමීටර් 17,316 ක හිඟයක් සහිතව කිලෝමීටර් 59,484 ක් එකතුව රු.මිලියන 3.66 ක වියදමක් දරමින් ධාවනය කර තිබු බව නිරීක්ෂණය විය.

(ආ) තවද, ව්‍යාපෘතිය විසින් 2017 අප්‍රේල් 24 දින රු.මිලියන 14.05 ක පිරිවැයක් දරමින් තවත් මෝටර් රථයක් ප්‍රසම්පාදනය කිරීමට ක්‍රියාකර තිබුණු අතර, 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය නිම කිරීමට සැලසුම් තිබියදී නව මෝටර් රථයක අවශ්‍යතාවය විගණනයේදී නිශ්චය කිරීමට නොහැකි විය.

## 3.5 ව්‍යාපෘතියට අදාළ නොවූ ක්‍රියාකාරකම්

ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට සෘජු සම්බන්ධතාවයක් නොමැතිව මාර්ග සංවර්ධන අධිකාරියේ භාවිතය සඳහා රු.මිලියන 2.89 ක පිරිවැයක් දරමින් මුද්‍රණ යන්ත්‍රයක් සහ වෙනත් උපාංග ප්‍රසම්පාදනය කර තිබුණු බව නිරීක්ෂණය විය.